# ශ්‍රී ලාංකේය ගැමි නිවසෙහි  ශිල්පීය තාක්‍ෂණය හා වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ පිළිබඳ සේනාසනඛන්ධකය ඇසුරෙන් විමර්ශනයක්

පූජ්‍ය, දිවුලපැලැස්සේ රතනවංශ හිමි[1], එච්.එම්.සි. එන්. ගුණවර්ධන[2], එස්.එම්.ඒ. ප්‍රියදර්ශන[3]

## හැඳින්වීම

සමාජයේ ජීවත්වන සියල්ලෝ ම ශීත, උෂ්ණ රුදුරු වන සතුන්ගෙන් හා මැසි මදුරුවන්ගෙන් සිදු වන පීඩා මඟහරවා ගැනීම සඳහා වාසස්ථානයක් භාවිත කිරීම සාමාන්‍ය වුව ද එහි විධිමත් නිවාසකරණය බෞද්ධ දර්ශනයට අනුව ඉතිහාසය පිළිබඳ විමසා බැලීමේ දී භික්‍ෂූන් වහන්සේ වෙනුවෙන් ආරාම පිළිගැනීම සඳහා අනුදැන වදාළ බුදුරජාණන් වහන්සේ පරිසර හිතකාමී ව නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය සංරක්‍ෂණ ශිල්පීය තාක්‍ෂණය පිළිබඳ ව ද දේශනා කළහ. ඒ පිළිබඳ තොරතුරු ද චුල්ලවග්ගපාළියේ සෙනාසනක්ඛන්ධකයෙහි සඳහන් වේ. බුදුදහම ලංකාවට ලැබීමත් සමඟ සංස්කෘතික වශයෙන් සිදු වූ විපර්යාසයේ එක් පියවරක් ලෙස ගෘහනිර්මාණ කලාවේ සභ්‍යත්ව ලක්‍ෂණ පිළිබිඹු වීම පෙන්වා දිය හැකි ය. ග්‍රාමීය පරිසරයේ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් බෞද්ධ දර්ශනය තුළින් අත්පත් කරගත් දැනුම ආභාසයට ගෙන නිර්මාණය කරන ලද ගැමි නිවාසයන්හි වාස්තුවිද්‍යාත්මක හා ශිල්පීය කුසලතා පිළිබඳ අනුරාධපුර කරුවලගස්වැව ගැමි නිවාස මූලික කරගෙන විමර්ශනයක් සිදු කරන ලදී.

## පර්යේෂණ අරමුණ

වර්තමාන ගෘහනිර්මාණ තාක්‍ෂණයේ දී වාස්තුවිද්‍යා ලක්‍ෂණ පිළිබඳ අවධානය යොමු කරන අතර, ඒ පිළිබඳ අතීතයේ දී භාවිත පරිසර හිතකාමි උරුම තාක්‍ෂණය හඳුනා ගැනිම හා එවකට පැවති පෙදරේරු කර්මාන්තයයේ ස්වභාවය අවබෝධ කර ගැනීම

## පර්යේෂණ ක්‍රමවේදය

ග්‍රන්ථ සංධාර ක්‍රමවේදය යටතේ මූලාශ්‍රය අධ්‍යයනය, හා ක්ෂේත්‍ර ගවේෂණය තුළින් ද වැඩිදුර අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡා මඟින් හා අන්තර්ජාලය තුළින් තොරතුරු රැස් කරගන්නා ලදී.

## පර්යේෂණ ගැටලුව

ග්‍රාමීය ගෘහනිර්මාණ කලාව සඳහා සේනසනක්ඛන්ධකයේ ඉගැන්වෙන පරිසර හිතකාමී ශිල්පීය හා වාස්තුවිද්‍යාත්මක දැනුම යොදාගෙන තිබුණේ ද? යන්න විමසා බැලීමයි.

## පර්යේෂණ සාහිත්‍ය විමර්ශන

ලංකාවේ ගෘහනිර්මාණ කටයුතු ආරම්භ වන්නේ ක්‍රි.පූ. 6 වන සියවසේ දී ඉන්දියාවේ සිට මෙරටට සම්ප්‍රාප්ත වූ විජය රජුගේ අගමෙහෙසිය සමඟ පැමිණි අටලොස් ශිල්පීන් අතර වූ කණ්ඩායමකින් බව

[1]. පුරාවිද්‍යා (විශේෂ), සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්‍ෂු විශ්වවිද්‍යාලය.
*vendrathanawansha@gmail.com*
[2]. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
[3]. ජනසන්නිවේදන (විශේෂ) ජනසන්නිවේදන අධ්‍යයනාංශය, සමාජ විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.

මහාවංසයේ සඳහන් වේ (Mv.viii. 57). ලේඛනගත ප්‍රභවයන්ට අනුව ශ්‍රී ලංකාවේ ගෘහනිර්මාණයේ ඉතිහාසය සම්බන්ධව එසේ සඳහන් වුව ද පුරාවිද්‍යාත්මකව ශ්‍රී ලංකාවේ ගෘහනිර්මාණ ශිල්පයේ ඉතිහාසය හැදෑරීමේ දී ඈත අතීතයට ගමන් කරන බව පෙන්වා දිය හැකි ය (තුසිත මැන්දිස්, 2011). කටුමැටි වරිච්චි භාවිත කොට ඉදිකර ඇති මෙවැනි පූර්ව ඓතිහාසික ග්‍රාමීය නිවාස ගොම මැටි ඇතිරූ ගෙබිමකින් ද කේතුකාකාර වහලකින් ද සමන්විත වන්නට ඇතැයි උපකල්පනය කරනු ලැබේ (Coningham, 1999). අනුරාධපුර මුල් අවධියේ ක්‍රමික වාස්තුවිද්‍යාත්මක නිර්මාණ ලක්ෂණයන් පෙරදැරි කොට ගත් දියුණු ගෘහනිර්මාණ කලාවක් මෙරට ව්‍යාප්තව පැවති බව සඳහන් කළ යුතු ය. ක්‍රි.පූ 3 වන සියවසේ මහින්දාගමනයත් සමඟ එකී නිර්මාණ ශෛලිය වඩාත් දියුණු වුණ බව පැහැදිලි ය, (විජේබණ්ඩාර, 2017). ගොඩනැඟිලි තනා තිබුණේ දැවයෙනි. ඇතැම්විට ඒ සඳහා මැටි හා කොළ අතු භාවිත විය, (ස්වර්ණා රණවීර, පි.136). ඓතිහාසික යුගයේ විසූ සාමාන්‍ය ජනයාගේ නිවාස දැවමය සැකිල්ලකට වරිච්චි මැටි යොදා දූවකණු සහ දැවවහල සහිත ව ඉදි කරන ලද බවත් වහල සඳහා පොල් අතු සහ පිදුරු ආදී වෘක්ෂලතා කොටස් භාවිතයට ගන්නට ඇති බවත් විද්වත් අදහස යි (කුමාරස්වාමි, 1962). තමන්ගේ වගා භූමිය ආරක්ෂා කරගැනීමට එම ස්ථානවල ම ගඩොල් හා මැටි භාවිත කර, ස්ථිර ලෙස වාසස්ථාන ඇති කරගන්නා ලදී. ඒවා එකළ කුඩා ග්‍රාමයන් ලෙස විකාශනය විය (ඩී.ඇම්. සූරතිස්ස, පි.264).

**පර්යේෂණ සාකච්ඡාව**

වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ උසුලන වරිච්චි බිත්ති නිවසක කාමර දෙකකින් සමන්විත ය. නිදන කාමරය මුළුතැන් ගෙය ලෙස ද භාවිත කළ අතර, ජනේල දැකිය නො හැකි ය. ඇතැම් නිවෙස්වල එකක් හෝ දෙකක් දැකිය හැකි ය. වාස්තුවිද්‍යානුකූල ව ගෘහයක් නිර්මාණය වීමේ දී අනුපිළිවෙළ මෙසේ ය.

| | | | |
|---|---|---|---|
| **01. බිම් සැලැස්ම** | **02. අත්තිවාරම** | **03. වරිච්චි බිත්ති** | **04. උළුවහු තැබීම** |
| **05. වහලය සැකසීම** | **06. ගෙබිම** | **07. වටපිළ ඉදිකිරීම** | |

සේනාසනක්ඛන්ධකයේ එන ආරාම නිර්මාණකරණය දෙස බැලීමේ දී තණ සෙවිලිකර තිබූ විහාරයේ සීත හා රස්නය සමව පැවති හෙයින් එයට ප්‍රතිකර්මයක් ලෙස සන දඬු යොදා ඇතුළත පිටත බදාම ආලේප කිරීමට අනුදැන වදාළ අතර, වාකවුළු නොමැති විහාරගෘහයට ගඩොලින්, දැලින් හා කුරුවලින් කළ වාකවුළු යෙදීමට අනුදැන වදාරයි. විවෘත වාකවුළු වැසීමට ජනෙල් පියන් ද බිම නිදා ගත් භික්ෂූන්ට පිළක් ද අනුදැන වදාරා තිබේ (චුල්ලවග්ගපාළි, පි.135). වරිච්චි බිත්ති පිරියම් කිරීම සඳහා අනුදැන වදාළ බුදුරජාණන් වහන්සේ ඒ සඳහා සුදු, කළු හා ගුරු පැහැය සුදුසු යැයි ද රළු බිත්තියේ එම ආලේපන නො බැඳෙන විට කළයුතු පිළියම් පිළිබඳ ව ද දේශනා කර තිබේ (චුල්ලවග්ගපාළි, පිටු.143-145).

එපමණක් නො ව ආරාමය මිටි බිම් සහිත අවස්ථාවේ වැසිදියෙන් පීඩා විඳින හෙයින් පස්බැම්ම අනුදැන වදාරා පසුව එයට ගඩොල් බැම්ම, ගල්බැම්ම, දඬු බැම්ම, යන අත්තිවාරම් යෝජනා කරන ලදී. ඉහළට ගොඩවීමට අපහසු විට ඒ සඳහා ගඩොල් හිනිපෙත්ත, ගල් හිණිපෙත්ත, දඬු හිණිපෙත්ත යන බැම් අනුදැන වදාරා තිබේ. ආරාමය ඇතුළත භික්ෂූන්ගේ පහසුව වෙනුවෙන් අඩ බිත්ති ඇතුළත ඉදිකරන්නත්, අනතුරු ව සිවුරුස්ගබ, නැලිගබ, සඳලුගබ යන තුන් කාමර අනුදැන වදාරා තිබේ (චුල්ලවග්ගපාළි,

පි.147). විහාරයේ බිත්ති වැසිදියෙන් ආරක්ෂා කර ගැනීම සඳහා දොරට ඉදිරියෙන් දෙපස බිත්ති බැඳ කළ ආලින්දය ද පිළක් නැති විහාරයට වටමාලය ද පිටතට පැන්නූ වහලය ද අනුදැන වදාරා තිබේ, (චුල්ලවග්ගපාළි, පි.149). අරමට අවශ්‍ය කරන පැන්හල, ගිනිහල්ගෙය ආදී සියලු අඞ්ගෝපාඞ්ග එකිනෙක විහාරභූමියට ඇතුළත් කරන අතර, එහි කල් පැවැත්ම වෙනුවෙන් විවිධ පිළියම් යොදා ඇති බවත් ක්‍රමයෙන් දොරපලු, දොරබාව, වටලීය, උතුරුලීය, දොරපොල්ල, අගුළුකණුව, තරඞ්කය ආදී කොටස් ඇතුළත් කරමින් එහි ආරක්ෂාව තර කර ඇති බව පැහැදිලි ය. විහාරයට අමතර ව විහාරභූමිය අවට අලඞ්කාර කරගැනීම සඳහා භූමිය සකස් කර ගැනීමත් සතුන්ගෙන් වන පීඩා මගහරවා ගැනීමටත් උණුවැට, වැටකේවැට හා දිය අගල ද අනුදැන වදාරා තිබේ (චුල්ලවග්ගපාළි, පිටු.155-157).

අනුරාධපුර ග්‍රාමීය නිවාසයන්ගේ බිම් සැලැස්ම ආයත චතුරස්‍රාකාර හෝ සමචතුරස්‍රාකාර ආකෘතියකින් යුක්ත වේ. නිවසේ ඉදිරිපස දොරටුව හැරුණු විට සීමිත ප්‍රවේශයන් ගණනකින් සමන්විත විය. සම්පූර්ණ නිවස වටා පිළ නිර්මාණය විය. පොළවේ ශක්තිමත් කොට තනා ඇති අත්තිවාරම හා නිවස තැනීමට යොදා ගත් කණුවලවල් නිවසේ බිම් ප්‍රමාණයේ සැලැස්ම හඳුනා ගැනීම සඳහා උපකාරී වේ. බිම් සැලැස්ම යනුවෙන් අදහස් කරනු ලබන්නේ නිවසට අමතර ව ගෙවත්තේ පරිබාහිර ව අනෙකුත් මූලිකාඞ්ග යි. එනම්,

| | | |
|---|---|---|
| **1. ප්‍රධාන වාසස්ථානය** | **2. මුළුතැන්ගෙය** | **3. දරමැස්ස** |
| **4. හරක්මඩුව** | 5. වැට | **6. ළිඳ** |

යන මූලික අඞ්ග ඇතුළත් විය. නිවසක ශක්තිය රඳා පවතින්නේ එහි ඇති අත්තිවාරම මත යි. නිවස සඳහා අවශ්‍ය ලීකණු සිටුවා ගත් පසු ගෙවත්ත අවටින් රැස් කර ගන්නා ලද ගල් කැබලි තබා මැටිටෙන් අත්තිවාරම බඳිනු ලැබේ. ප්‍රදේශ අනුව උසට බැඳීම හා නො බැඳීම තීරණය වේ. ගොඩනැඟිල්ලේ බර අනුව නොයෙකුත් අවස්ථාවන්ට ඔරොත්තු දෙන පරිදි සකස් කරන අත්තිවාරම් කිහිපයකි.

1. **පහුරු අත්තිවාරම**
2. **යමැසි අත්තිවාරම**
3. **ටැම් අත්තිවාරම**

ගැමි නිවසක විශේෂත්වය වනුයේ බොහෝ නිවාසවල ඉස්තෝප්පුව (පිළ) සකස් කිරීම යි. බිත්ති බැඳීමේ දී වරිච්චි බිත්තිය සඳහා ලී වර්ග බැඳීමේ දී කිරිවැල්, කලවැල්, මයිලපට්ට භාවිත කරයි. එමඟින් වරිච්චි බිත්තියට ශක්තියක් ලබාදෙන අතර, වරිච්චි බැඳ සූදානම් කර ගැනීමෙන් පසුව මැටි තැබීම සිදු කරයි. මෙම ක්‍රියාවලිය **"කටුමැට්ට තැබීම"** යනුවෙන් හැඳින්වේ. වහලට ඉලුක් සෙවිලි කිරීමෙන් පසුව ඒ මත පිදුරු සෙවිලි කරයි. සාමාන්‍යයෙන් පිදුරු, ඉලුක් සහ මානා වහලේ අතුරනු ලබනුයේ වහලේ අගුවේ සිටයි. පිදුරුවලට අමතර ව වහල සෙවිලි කිරීම සඳහා වර්තමානයේ පොල් අතු, තල් අතු ආදිය යොදා ගනු ලැබේ. සෑම අවුරුද්දක ම දෙවතාවක් පමණ පැරණි ඒවා ඉවත් කොට අලුත් පොල් අතු සෙවිලි කිරීම කරුවලගස්වැව ගම්මානයේ කැපී පෙනෙන කාර්යයක් වෙයි. සාමාන්‍යයෙන් ගැමි ගෙයකට

උළුවහු 2ක් සහ ජනේල 2ක් තැබීම ප්‍රමාණවත් ය. පසු කාලයේ දී වස්දොස් ඇති වීම නිසා නියමාකාරයෙන් පාද බෙදා තියන්නටත් උළුවහුවල වස් දුරුකර ගන්නටත් මිනිස්සු පුරුදු වූ බව ඔවුන් පෙන්වා දෙන ලදී. නිවස අභ්‍යන්තරයේ පස් දමා තද කර ගැනීමෙන් පසු හුඹස්මැටි, ගොම මිශ්‍ර කොට මතුපිට පොළවේ ආලේප කරයි. කරුවලගස්වැව ගම්මානයේ ගැමියන් මෙය සෑම සතියකට හෝ දෙකකට වරක් සිදු කරනු ලබයි. එසේ කරනුයේ ගොම පිරිබඩලීමෙන් හොඳ නිමාවක් සේම කුරුමිණි සතුන්ගෙන් නිවස ආරක්ෂා කර ගැනීමට ය. අනතුරු ව වටපිළක් බිත්තියට පිටතින් ගොඩනඟන අතර, මෙහි දී නිවස වටා අඩි දෙකක් පමණ උසකින් හා අඩියක් පමණ පළලකින් යුතු බැම්මක් සකස් කෙරේ. ඉන් පසුව මැටි, පස් හා ගොම ජලය සමඟ මිශ්‍ර කොට වටපිළ සඳහා ආලේප කරයි. නිවස සඳහා ගෙබිම හෙවත් වටපිළ නමැති අඞ්ගය එකතු වීම එහි අලඞ්කාරට හේතු වූවා මෙන් ම නිවසේ ආරක්ෂාව සඳහා භාවිත වූ අඞ්ගයක් වශයෙන් ප්‍රයෝජනවත් විය. ඉතා සරල එහෙත් වාස්තුවිද්‍යාත්මක ගෘහනිර්මාණ තාක්ෂණයක් හා සරල දිවිපෙවතක් ගත කරන බව දැකගත හැකි ය.

**ප්‍රතිඵල/පර්යේෂණ සමාලෝචනය**

මෙම පර්යේෂණයේ දී පැරන්නන් බුදුදහමේ ආභාසයෙන් පාරිසරික සම්පත් යොදා ගනිමින් ස්වාභාවික පරිසරයට උචිත වන ආකාරයෙන් තම ගෘහයන් නිර්මාණය කරගෙන තිබූ බවත් සතා සර්පාදීන්ගෙන් හා ස්වාභාවික ව සිදු වන කරදර අවම කර ගැනීම සඳහා බෞද්ධ විනයමාර්ගයේ සෙනාසනක්ඛන්ධකයේ සඳහන් වන සම්පත් භාවිතය හා වාස්තුවිද්‍යාත්මක තාක්ෂණය උපයෝගී කර තිබූ බව මෙම පර්යේෂණයේ දී හඳුනා ගැනීමට හැකි විය. තමා ජීවත් වන ගෘහය හා වටපිටාව නිර්මාණයේ දී ක්‍රමවත් ව නඩත්තු කරමින් ජීවිකා වෘත්තිය ද ඉතා සරල ආකෘතියකින් සිදු කරන බවත් සාමූහික ව සාමකාමී දිවිපෙවතක් ගත කරන බවටත් තහවුරු විය.

**ප්‍රමුඛ පදඃ** ආරාම කළමනාකරණය, ගැමි නිවාස, පරිසරය, වාස්තුවිද්‍යාව, සෙනසනක්ඛන්ධකය

**මූලාශ්‍රය**


- **චුල්ලවග්ගපාළි 2.** (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමලා. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- යමුනා, හේරත් (2005). **ආදි ලක්දිව මානවකටයුතු සඳහා ශාක භාවිතය.** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- විජේස්කර, නන්දදේව (1986). **ලංකා ජනතාව.** කොළඹඃ ගුණසේන සහ සමාගම.
- සේපාල, අමරසේකර (2001). **ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජනතාව.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- http://**www.divaina.com**/2011/07/06/badada01.html